දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................

මගේ අංකය / எமது இல. / My No. ED/29/2/2/5

දිනය / திகதி / Date 2014.11.10

චක්‍රලේඛ අංක :- 35/2014

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

<u>ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රතිෂ්ඨාපනය කිරීම</u>

1995.04.03 දිනැති අංක 865/3, 1997.03.11 දිනැති අංක 966/5 සහ 1997.05.14 දිනැති අංක 975/6 දරණ ගැසට් පත්‍ර (අතිවිශේෂ) මගින් ද වරින් වර කරන ලද සංශෝධන සහිතව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1994.10.31 දිනැති 843/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයට අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් තීරණයකට අගතියක් නොවන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත 2008/07/01 දින සිට ක්‍රියාත්මක වන සේ ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රතිෂ්ඨාපනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇත.

එම ව්‍යවස්ථාවේ පිටපතක් මේ සමඟ යොමු කරන අතර එහි සඳහන් විධිවිධාන පහත සඳහන් උපදෙස් ද අනුගමනය කරමින් නොපමාව ක්‍රියාත්මක කරන ලෙස අවධාරණය කරමි.

1. **ක්‍රියාත්මක කිරීම.**

   ප්‍රතිසංවිධිත ගුරු සේවා ව්‍යවස්ථාව 2008.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

   (අ) ඒ අනුව 2008.07.01 දිනට සේවයේ යෙදී සිටි සියළු ගුරුවරුන් මෙම ගුරු සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කළ යුතුය.

   (ආ) 2008.07.01 දිනෙන් පසුව සේවයට බඳවා ගත් ගුරුවරුන් සඳහා ද මෙම ගුරුසේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ වේ.

2. වැටුප් ගෙවීම.

   අන්තර්ග්‍රහණය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව නව වැටුප් පරිමාණයන් අනුව වැටුප් ගෙවිය යුතු වන්නේ 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදිය. අන්තර්ග්‍රහණය ක්‍රියාත්මක වන 2008.07.01 දින සිට 2010.12.31 දක්වා කාලය තුළ වැටුප් ගෙවීම 2008.07.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006(IV) හි සඳහන් වැටුප් පරිමාණයන් යටතේ වුවද නව ව්‍යවස්ථාව අනුමත වීමට පෙර එම කාලය තුළ (2008.07.01 සිට 2010.12.31 දක්වා) විශ්‍රාම ගිය ගුරුවරුන්ගේ වැටුප කල්පිත පදනම යටතේ පරිවර්තනය කර ඒ අනුව සංශෝධිත විශ්‍රාම වැටුප 2011.01.01 දින සිට ගෙවිය යුතුය. 2011.01.01 දිනට පසු මේ දක්වා විශ්‍රාම ගොස් ඇති ගුරුවරුන් සංශෝධිත වැටුප යටතේ ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප ද විශ්‍රාම ලද දිනයේ සිට ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතුය.

**3.** අන්තර්ග්‍රහණය

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින ගුරුවරුන් ප්‍රතිසංවිධිත ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථාවට අනුව අන්තර්ග්‍රහණය කිරීම පහත දැක්වෙන පරිදි සිදු කළ යුතුය.

➢ **සේවයේ 3- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම**

ක්‍රියාත්මක වන දිනට සේවයේ 3-II ශ්‍රේණියේ සිටින සියලු ගුරුවරුන් ප්‍රතිසංවිධිත ව්‍යවස්ථාවේ 3-II ශ්‍රේණියට ද,

➢ **සේවයේ 3- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම**

**(අ)** සේවයේ 3- I ශ්‍රේණියේ සිටින ඩිප්ලෝමා සුදුසුකම් සහිත ගුරුවරුන් ප්‍රතිසංවිධිත ව්‍යවස්ථාවේ 3- I (ඇ) ශ්රේණියට ද,

**(ආ)** සේවයේ 3- I ශ්‍රේණියේ සිටින පුහුණු ගුරුවරුන් ප්‍රතිසංවිධිත ව්‍යවස්ථාවේ 3- I (ආ) ශ්‍රේණියට ද,

**(ඇ)** සේවයේ 3- I ශ්‍රේණියේ සිටින උපාධිධාරී ගුරුවරුන් ප්‍රතිසංවිධිත ව්‍යවස්ථාවේ 3- I (අ) ශ්‍රේණියට ද,

අන්තර්ග්‍රහණය කළ යුතු ය.

➢ **සේවයේ 2- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම**

සේවයේ 2- II ශ්‍රේණියේ සිටින ගුරුවරුන් ප්‍රතිසංවිධිත ව්‍යවස්ථාවේ 2- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතු ය.

➢ **සේවයේ 2- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම**

සේවයේ 2- I ශ්‍රේණියේ සිටින ගුරුවරුන් ප්‍රතිසංවිධිත ව්‍යවස්ථාවේ 2- I ශ්‍රේණියට අන්තර්ග්රහණය කළ යුතු ය.

➢ **සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම**

සේවයේ I පන්තියේ සිටින ගුරුවරුන් ප්‍රතිසංවිධිත ව්‍යවස්ථාවේ I වන පන්තියට අන්තර්ග්‍රහණය කළ යුතු ය.

**4.** වැටුප් ක්‍රමය

ප්‍රතිසංවිධිත ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2008.07.01 දිනට සේවයේ සිටින ගුරුවරුන් ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කළ යුත්තේ 2010.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (viii) හි උපලේඛන II හි සඳහන් විධිවිධාන අනුව වන අතර එහි සඳහන් පරිදි අදාළ වැටුප් පියවරේ පිහිටුවිය යුත්තේ පහත පරිදිය.

වැටුප් පරිමාණය

**ජී.ඊ.-1-2006** -රු.13,410 -145 x 6 – 180 x 7 – 215 x 1 - 15,755

**ජී.ඊ. -2-2006** - රු. 16,100 – 240 x 5 – 330 x 5 – 400 x 7 – 645 x 20 – 34,650

I. ක්‍රියාත්මක වන දිනට 3-II ශ්‍රේණියේ සිටින ගුරුවරුන් 2007.08.24 දිනැති අංක 06/2006 (iv) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ලබන වැටුප් පියවර අනුව උපලේඛන II හි "යෝජිත පියවර" තීරුව යටතේ සඳහන් අනුරූපී වැටුප් පියවෙරහි පිහිටුවිය යුතුය.

II. ක්‍රියාත්මක වන දිනට 3-I ශ්‍රේණියේ සිටින ගුරුවරුන් පහත පරිදි අන්තර්ග්‍රහණය කළ යුතුය.

(අ) ව්‍යවස්ථාවේ 13.11 හි සඳහන් ඩිප්ලෝමාව සහිත ගුරුවරුන් උපලේඛන II හි "ශ්‍රීලං.ගු.සේ. 3-I ඩිප්ලෝමාධාරී" යන ශීර්ෂය යටතේ දක්වා ඇති වැටුප් පියවරයන් පාදක කර ගනිමින් 3-I (ඇ) ශ්‍රේණියට අදාළ අනුරූපි වැටුප් පියවරෙහි පිහිටුවිය යුතු ය.

(ආ) ව්‍යවස්ථාවේ 13.9 හි සඳහන් ගුරු පුහුණුව සමත් ගුරුවරුන් උපලේඛන II හි "ශ්‍රීලං.ගු.සේ. 3-I පුහුණු ගුරු" යන ශීර්ෂය යටතේ දක්වා ඇති වැටුප් පියවර පාදක කර ගනිමින් 3-I (ආ) ශ්‍රේණියට අදාළ අනුරූපි වැටුප් පියවරෙහි පිහිටුවිය යුතු ය.

(ඇ) ව්‍යවස්ථාවේ 13.7 හි සඳහන් උපාධිය සහිත ගුරුවරුන් උපලේඛන II හි "ශ්‍රීලං.ගු.සේ. 3-I උපාධිධාරී ගුරු" යන ශීර්ෂය යටතේ දක්වා ඇති වැටුප් පියවරයන් පාදක කර ගනිමින් 3-I (අ) ශ්‍රේණියට අදාළ අනුරූපි වැටුප් පියවරෙහි පිහිටුවිය යුතු ය.

III. ක්‍රියාත්මක වන දිනට 2- II ශ්‍රේණියේ සිටින ගුරුවරුන් පහත පරිදි අන්තර්ග්‍රහණය කළ යුතුය.

(අ) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I ශ්‍රේණියේ සිට 2- II ශ්‍රේණියට උසස්වීම් ලැබූ ගුරුවරුන් උපලේඛන II හි 3-I සිට උසස් කළ ශීර්ෂය යටතේ සඳහන් "පරිවර්තනයේ දී ගෙවිය යුතු" යන උපශීර්ෂය යටතේ දක්වා ඇති වැටුප් පියවරයන් පාදක කර ගනිමින් අනුරූපී වැටුප් පියවරෙහි පිහිටුවිය යුතුය.

(ආ) ක්‍රියාත්මක වන 2008.07.01 දිනට 2- II ශ්‍රේණියේ සිටින 2- II ශ්‍රේණියට පත් කරන ලද

i. ව්‍යවස්ථාවේ 13.9 හි සඳහන් ගුරු පුහුණුව සමඟ ව්‍යවස්ථාවේ 13.7 හි සඳහන් උපාධිය සහිත ගුරුවරුන්
ii. ව්‍යවස්ථාවේ 13.8 හි සඳහන් අධ්‍යාපනවේදී උපාධිය සහිත ගුරුවරුන්
iii. ව්‍යවස්ථාවේ 13.07 හි සඳහන් උපාධිය සහ ව්‍යවස්ථාවේ 13.14 හි සඳහන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සහිත ගුරුවරුන්

පහත පරිදි වැටුප් පියවරයන්හි පිහිටුවිය යුතුය.

| රා.ප.ච.ලේ අංක (6/2006 IV) අනුව වැටුප් පියවර | පරිවර්තනයේදී පිහිටුවිය යුතු වැටුප් පියවර |
|---|---|
| 15995 | 16580 |
| 16235 | 16820 |
| 16475 | 17060 |
| 16715 | 17300 |
| 16955 | 17630 |
| 17195 | 17960 |
| 17525 | 18290 |
| 17855 | 18620 |
| 18185 | 18950 |
| 18515 | 19280 |
| 18845 | 19610 |
| 19175 | 19940 |
| 19505 | 20270 |
| 19835 | 20600 |
| 20165 | 20930 |
| 20495 | 21260 |

(ඇ) ප්‍රතිෂ්ඨාපිත ගුරු සේවා ව්‍යවස්ථාවේ 13.7 හි සඳහන් උපාධිය සහ 13.14 හි සඳහන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සහ 13.15 හි සඳහන් අධ්‍යාපන පශ්චාත් උපාධිය යන සුදුසුකම සහිත ගුරුවරුන් පහත පරිදි වැටුප් පියවරෙහි පිහිටුවිය යුතුය.

| රා.ප.ච.ලේ අංක (6/2006 IV) අනුව වැටුප් පියවර | පරිවර්තනයේදී පිහිටුවිය යුතු වැටුප් පියවර |
|---|---|
| 15995 | 17060 |
| 16235 | 17300 |
| 16475 | 17630 |
| 16715 | 17960 |
| 16955 | 18290 |
| 17195 | 18620 |
| 17525 | 18950 |
| 17855 | 19280 |
| 18185 | 19610 |
| 18515 | 19940 |
| 18845 | 20270 |
| 19175 | 20600 |
| 19505 | 20930 |

| | |
|---|---|
| 19835 | 21260 |
| 20165 | 21590 |
| 20495 | 21920 |

**IV.** ප්‍රතිෂ්ඨාපිත ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2008.07.01 දිනට පෙර ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියේහි සිට 2-I ශ්‍රේණියට උසස්වීම් ලබා 2008.07.01 දිනට සේවයේ 2- I ශ්‍රේණියේ සිටින ගුරුවරුන් උපලේඛන 2 හි සඳහන් "ශ්‍රීලංගුසේ 2-I" ශීර්ෂය යටතේ "පරිවර්තනයේදී ගෙවිය යුතු" යන තීරය යටතේ දක්වා ඇති වැටුප් පියවරයන් පාදක කර ගනිමින් පහත පරිදි වැටුප් පියවරයෙහි පිහිටුවිය යුතුය.

**(අ)** ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියේ සිට 2-I ශ්‍රේණියට උසස්වීම් ලද පහත සඳහන් ගුරුවරුන්

i. ව්‍යවස්ථාවේ 13.9 හි සඳහන් ගුරු පුහුණුව සමඟ ව්‍යවස්ථාවේ 13.7 හි සඳහන් උපාධිය සහිත ගුරුවරුන් සහ

ii. ව්‍යවස්ථාවේ 13.8 හි සඳහන් අධ්‍යාපනවේදී උපාධිය සහිත ගුරුවරුන් සහ

iii. ව්‍යවස්ථාවේ 13.07 හි සඳහන් උපාධිය සමඟ ව්‍යවස්ථාවේ 13.14 හි සඳහන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සහිත ගුරුවරුන් සහ

iv. ව්‍යවස්ථාවේ 13.07 හි සඳහන් උපාධිය සහ 13.14 හි සඳහන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සහ 13.15 හි සඳහන් අධ්‍යාපන පශ්චාත් උපාධිය සහිත ගුරුවරුන් පහත පරිදි වැටුප් පියවරෙහි පිහිටුවිය යුතුය.

| රා.ප.ච.ලේ අංක (6/2006 **IV**) අනුව වැටුප් පියවර | පරිවර්තනයේදී පිහිටුවිය යුතු වැටුප් පියවර |
|---|---|
| 18845 | 19350 |
| 19245 | 19750 |
| 19645 | 20150 |
| 20045 | 20550 |
| 20445 | 20950 |
| 20845 | 21350 |
| 21245 | 21750 |
| 21645 | 22150 |
| 22045 | 22550 |
| 22445 | 22950 |
| 22845 | 23350 |
| 23245 | 23750 |
| 23645 | 24150 |

(ආ) ඉහත අංක IV යටතේ සඳහන් ගුරුවරු ප්‍රතිෂ්ඨාපිත ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2008.07.01 දිනට 2-I ශ්‍රේණියේ සිටින 2-II ශ්‍රේණියේ සිට 2-I ශ්‍රේණියට උසස් කරන ලද අනෙකුත් ගුරුවරුන් උපලේඛන 2 හි "පරිවර්තනයේදී ගෙවිය යුතු වැටුප" යන තීරය යටතේ සඳහන් වැටුප් පියවරයන්හි පහත පරිදි පිහිටුවිය යුතුය.

| රා.ප.ච.ලේ අංක (6/2006 **IV**) අනුව වැටුප් පියවර | පරිවර්තනයේදී පිහිටුවිය යුතු වැටුප් පියවර |
|---|---|
| 18845 | 18950 |
| 19245 | 19350 |
| 19645 | 19750 |
| 20045 | 20150 |
| 20445 | 20550 |
| 20845 | 20950 |
| 21245 | 21350 |
| 21645 | 21750 |
| 22045 | 22150 |
| 22445 | 22550 |
| 22845 | 22950 |
| 23245 | 23350 |
| 23645 | 23750 |

**V.** ප්‍රතිෂ්ඨාපිත ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මකවන 2008.07.01 දිනට පෙර ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-I ශ්‍රේණියේ හි සිට 1 ශ්‍රේණියට උසස්වීම් ලැබූ ගුරුවරුන් උපලේඛන 2 හි සඳහන් "ශ්‍රීලං.ගු.සේ. 1" ශීර්ෂය යටතේ "පරිවර්තනයේදී ගෙවිය යුතු වැටුප්" තීරය යටතේ දක්වා ඇති වැටුප් පියවරයන් පාදක කර ගනිමින් පහත පරිදි වැටුප් පියවරෙහි පිහිටුවිය යුතුය.

(අ) 2008.07.01 දිනට පෙර ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 ශ්‍රේණියට උසස්වීම් ලද පහත සඳහන් ගුරුවරුන්

i. ව්‍යවස්ථාවේ 13.09 හි සඳහන් ගුරු පුහුණුව සමඟ ව්‍යවස්ථාවේ 13.07 හි සඳහන් උපාධිය සහිත ගුරුවරුන්,

ii. ව්‍යවස්ථාවේ 13.08 හි සඳහන් අධ්‍යාපනවේදී උපාධිධාරීන්,

iii. ව්‍යවස්ථාවේ 13.07 හි සඳහන් උපාධිය සමඟ ව්‍යවස්ථාවේ 13.14 හි සඳහන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සහිත ගුරුවරුන්,

iv. ව්‍යවස්ථාවේ 13.07 හි සඳහන් උපාධිය සහ 13.14 හි සඳහන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සහ 13.15 හි සඳහන් අධ්‍යාපන පශ්චාත් උපාධිය සහිත ගුරුවරුන් පහත පරිදි වැටුප් පියවරෙහි පිහිටුවිය යුතුය

| රා.ප.ච.ලේ අංක (6/2006 **IV**) අනුව වැටුප් පියවර | පරිවර්තනයේදී පිහිටුවිය යුතු වැටුප් පියවර |
|---|---|
| 21645 | 22395 |
| 22290 | 23040 |
| 22935 | 23685 |
| 23580 | 24330 |
| 24225 | 24975 |
| 24870 | 25620 |
| 25515 | 26265 |
| 26160 | 26910 |
| 26805 | 27555 |
| 27450 | 28200 |
| 28095 | 28845 |
| 28740 | 29490 |
| 29385 | 30135 |
| 30030 | 30780 |

**(ආ)** ඉහත සඳහන් අංක IV යටතේ සඳහන් ගුරුවරුන් හැර ප්‍රතිෂ්ඨාපිත ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මකවන 2008.07.01 දිනට පෙර 2-I ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කරන ලද අනෙකුත් ගුරුවරුන් උපලේඛන 2 හි "පරිවර්තනයේදී ගෙවිය යුතු වැටුප" යන තීරය යටතේ සඳහන් වැටුප් පියවරයන් පාදක කර ගනිමින් පහත පරිදි අදාළ වැටුප් පියවරයෙහි පිහිටුවිය යුතුය.

| රා.ප.ච.ලේ අංක (6/2006 **IV**) අනුව වැටුප් පියවර | පරිවර්තනයේදී පිහිටුවිය යුතු වැටුප් පියවර |
|---|---|
| 21645 | 21750 |
| 22290 | 22395 |
| 22935 | 23040 |
| 23580 | 23685 |
| 24225 | 24330 |
| 24870 | 24975 |
| 25515 | 25620 |
| 26160 | 26265 |

| | |
|---|---|
| 26805 | 26910 |
| 27450 | 27555 |
| 28095 | 28200 |
| 28740 | 28845 |
| 29385 | 29490 |
| 30030 | 30135 |

**05. ක්‍රියාත්මක වන දිනට සිටින ශ්‍රේණිය තීරණය කිරීම.**

නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වනුයේ 2008.07.01 දින සිට වන බැවින් අන්තර්ග්‍රහණයේදී ගුරුවරයා සිටින ශ්‍රේණිය වශයෙන් සැලකිය යුත්තේ 2008.07.01 දිනට සිටින ශ්‍රේණියයි. ක්‍රියාත්මක වන දිනට පසු පැරණි ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද චක්‍රලේඛ මඟින් දී ඇති උසස්වීම් නව සේවා ව්‍යවස්ථාව අනුව 2008.07.01 දිනට සිටින ශ්‍රේණිය පාදක කරගෙන සංශෝධනය විය යුතුය.

**06. උසස් කිරීම.**

නව ව්‍යවස්ථාව යටතේ උසස්වීම් ලබාදිය යුත්තේ ව්‍යවස්ථාවේ 10 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන යටතේය. අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව උසස්වීම් අදාල වනුයේ එම උසස්වීම හිමිවන දිනට සේවයේ යෙදී සිටින ගුරුවරුන් සඳහා පමණි.

යම් ගුරුවරයකු අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව 2008.07.01 දින සිටම ව්‍යවස්ථාවේ 10 වන වගන්තිය යටතේ උසස්වීම් ලබා ගැනීම සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය හැකි ය. එවැනි ගුරුවරුන් සඳහා 2014/10/23 දිනයේ සිට 2017/10/22 දක්වා වසර තුන(3)ක් තුළ ශ්‍රේණියේ උසස්වීම් ලබා දීමේ කාර්යය සඳහා සේවා කාලය සහ අනෙකුත් අවශ්‍යතා හැර වෘත්තීය සමාලෝචනය සහ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවයෙන් නිදහස් කළ යුතුය. ඒ අනුව එම කාලය තුළ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කරන ගුරුවරුන් හට උසස්වීම් ලබා දිය යුතුය.

එවැනි උසස්වීම් ලබා දෙනු ලබන අවස්ථාවක දී වැටුප් පරිවර්තනය කළ යුත්තේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5 වන වගන්තිය අනුව ය.

සටහන- අන්තර්කාලයෙන් පසුව එනම් 2017/10/23 දිනෙන් පසුව වන උසස් වීම් සඳහා මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධාන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වේ.

**07. ව්‍යවස්ථාවේ 13.9 (අ) හි සඳහන් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරු පුහුණුව ලත් ගුරුවරුන්ගේ වැටුප**

ප්‍රතිෂ්ඨාපිත ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2008.07.01 දිනට ව්‍යවස්ථාවේ 13.9 (අ)හි සඳහන් සුදුසුකම් සහිත 3-I ශ්‍රේණියේ සිටින ගුරුවරුන්ගේ වැටුප ඉහත 3 II (ආ) හි සඳහන් පරිදි පළමුව පරිවර්තනය කළ යුතුය

ඉන් අනතුරුව එලෙස වැටුප් පරිවර්තනය කළ ගුරුවරුන්ගෙන් 2015.01.01 දිනට 3-I ශ්‍රේණියේ සිටින ගුරුවරුන්ගේ වැටුප උපලේඛන II හි සඳහන් 3 වන පියවර වන රු 15000 සිට පියවරෙන් පියවර ක්‍රමයට පරිවර්තනය කළ යුතුය

**08. වැටුප් වර්ධක දිනය**

අන්තර්ග්‍රහණය කිරීම මත වැටුප් පරිවර්තනය කිරීම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(VIII) උපලේඛනයේ (ii) හි සඳහන් පරිවර්තන වගුව සහ චක්‍රලේඛයේ 3.3 ඡේදය

යටතේ සිදු කළ යුතු ය. අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවිය යුතුය

09. අන්තර්ග්‍රහණය සහ උසස්වීම් මේ සමග අමුණා ඇති ආකෘති පත්‍ර අනුව සිදු කළ යුතුය. ජාතික පාසල් වල සේවය කරන ගුරුවරුන්ගේ අන්තර්ග්‍රහණය හා උසස් වීම් අදාල ආකෘති පත්‍ර අනුව සම්පූර්ණ කර නිර්දේශය සහිතව අනුමැතිය සඳහා මා වෙත යොමු කළ යුතුය.

10. මෙම ප්‍රතිසංවිධිත ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේදී හෝ මෙම උපදෙස් අනුගමනයේදී කිසියම් පැහැදිලි කිරීමක් වන්නේ නම් මා වෙත යොමුකර උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

11. **කාර්යක්ෂම කඩඉම සඳහා අදාල වන මොඩියුල ක්‍රියාත්මක කිරීම**

මෙම මොඩියුල ක්‍රියාත්මක වන ක්‍රමවේදය පිළිබඳව ඉදිරියේදී අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය මගින් චක්‍රලේඛ උපදෙස් නිකුත් කරනු ලැබේ

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

1. ලේකම්- රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
2. ලේකම්- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.